# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2414/08 - 2024 දෙසැම්බර් මස 10 වැනි අඟහරුවාදා - 2024.12.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරන ලද නිවේදනයයි

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීම**

මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාරවර එස්. බී. එස්. අභයකෝන් වන මා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව, මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 2(2),2(4) උපවගන්ති අනුව පහත අංක I වැනි තීරුවේ නම සඳහන් මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය) වෙත III වැනි තීරුවේ සඳහන් බලතල II වැනි තීරුවේ සඳහන් දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරා දෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| බී. එම්. පී. එස්. බී. බස්නායක මහතා | 2024.07.22 | මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 10 දරන මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් අංක 58, (2අ, 3, 4, 5 උපවගන්ති හැර) 59, 60අ, සහ 1973 සමුපකාර සමිති රීති මාලාවේ අංක 43, 48, 49, (12ආ, ඇ, ඈ, ඉ උපවගන්ති හැර) 52, 53 යන රීති යටතේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් සතු බලතල. |

**මහාචාර්ය එස්. බී. එස්. අභයකෝන්,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

EOG 12 - 0084

1A - PG 6941 — 14 (2024/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*